# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී

අංක 7,716 — 1929ක්වූ ජූනි මස 14 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### උපාධ්‍යා නීති.

K 692/27

**1896යේ අංක 13 දරන ආඥාපණත.**

දකුණු පළාතේ මාතර ඩිස්ත්‍රික්කයේ දෙවුන්දර දේවාලයේ පවත්වන්නට අදහස්කර තිබෙන පෙරහැර මඞ්ගල්‍යය පිළිබඳව කාරක මන්ත්‍රිසභාගත ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් වර්ෂ 1896යේ අංක 13 දරණ ආඥාපණතේ පළමුවෙනි වගන්තිය යටතේ සම්පාදනය කරනලද නියෝග.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

එෆ්. ජී. ටිරල්,
වැඩබලන මහ ලේකම්තැන වම්හ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 11වෙනි දින කොළඹ
මහ ලේකම්තැනගේ කන්තෝරුවේදීය.

———

**දෙවුන්දර දේවාලයේ පෙරහැර මඞ්ගල්‍යය.**

**1896යේ අංක 13 දරන වන්දනාගමන් පිළිබඳ ආඥාපණත යටතේ සම්පාදනය කරනලද ව්‍යවස්ථා.**

1 දෙවුන්දර දේවාලයට පෙරහැර මඞ්ගල්‍ය සඳහා යන වන්දනාකාරයන්ට දෙවුන්දර නැවතීසිටීමට අවසර ඇති කාලය එකළොස් දවසකි; එනම්, 1929යේ ජූලි මස 19 වන දින පටන් ජූලි මස 29 වන දින දක්වා පමණකි. මුලින්කී දිනට මත්තෙන් පැමිණෙන්නාවූ හෝ මෙහි නියමකළ කාලයට වඩා නතරවන්නාවූ වන්දනාකාරයෝ වරදක්කිරීම ගැන වැරදිකාරයෝ වෙත්.

2. පෙරහැර කාලයේදී හෝ ඊට කලින් දෙවුන්දර හෝ ඒ අසල බෝවෙන පැතිරෙන නොහොත් වසංගත ස්වභාවයේ යම් රෝගයක් පටන්ගත්තොත් නැත්නම් උප දිසාපතිතුමාගේ කල්පනාවේ හැටියට වන්දනාකාලයේදී දෙවුන්දරට පැතිර එන්ට පුළුවන් දකුණු පළාතේ වෙනයම් ස්ථානයක එබඳු රෝගයක් පවතීනම් වන්දනාගමන තහනම්කරන්නට හෝ පෙරහැර කාලය අවසානවූයේයයි ප්‍රකාශකරන්නටද දෙවුන්දරට පිටින් ඇවිත්සිටි සියල්ලන්ටම වහාම ඉන් පිටවී තමතමන්ගේ ගම්වලට හැරීයන්ට නියමකරන්නටද ඔවුන් යායුතු මාර්ග මේ මේයයි නියමකරන්නටද උප දිසාපතිතුමාට නීති ප්‍රකාර බලය තිබේ. උප දිසාපතිතුමාගේ ආඥා නොතලකන යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

3. බෝවෙන නොහොත් පැතිරෙන රෝගයකින් පෙළෙමින් ඒ බව වහාම සනීපාරක්ෂක පරීක්ෂකතැනට හෝ වෛද්‍ය මූලාදෘනිතැනට හෝ ඔවුන් නැතිවිට, දෙවුන්දර සිටින පොලිසියේ මූලාදෘනීන් අතුරෙන් උසස් මූලාදෘනියාට නොදන්වාසිටින යමෙක් ඇද්ද, තවද එබඳු රෝගයක් පවතින බැව් වසන්කරගැනීමට අනුබලදෙන්නාවූ හෝ ආධාරකරන්නාවූ යමෙක් ඇත්ද එබඳු අය අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

4. පෙරහැර මඞ්ගල්‍ය පවතිනා අතර මස් මාලු හෝ එළවලු විකිණීම පිණිස උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් හෝ වෙන්කොට තබාතිබෙන ස්ථානයේ හැර දෙවුන්දර වෙන යම්කිසි තැනක ඒ ද්‍රව්‍ය යමෙක් විකුණන්නේද, සනීපාරක්ෂක පරීක්ෂකතැන විසින් හෝ වෛද්‍ය මූලාදෘනිතැන විසින් හෝ ඔවුන් නැතිවිට මුදලිතැන

විසින් හෝ දෙවුන්දර සිටින පොලිසියේ මූලාදෘනීන් අතුරෙන් උසස් මූලාදෘනියා විසින් හෝ කෑමට නුසුදුසුයයි කියන මසක් හෝ කිසියම් ආහාර පානාදියක් යමෙක් විකුණන්නේද එබඳු අය අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

5. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් මැනවයි පිළිගන්නාලද ස්ථානයක එසේ පිළිගන්නාලද ආකාරයකට සෑහෙන වැසිකිළි පහසු තැනීම ගැන පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයා හෝ (එය බද්දට දීතිබේනම්) බදුකාරයා වගකියයුත්තේය. එබඳු වැසිකිළි පෙරහැර මඞ්ගල්‍යය පවත්වන මුළුකාලයට පවතින්ට සෑහෙන අන්දමට තිබිය යුතුයි. ඒවායේ සැලැස්මවල් (ප්ලෑන්) හා විස්තර උප දිසාපතිතුමාගේ හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැනගේ අනුමතය ලබාගැණීම පිණිස පෙරහැර පටන්ගන්නට දහදිනකටවත් මත්තෙන් යැවිය යුතුයි. ඒ අැරත් කොහුබත් හෝ වැලිද උප දිසාපතිතුමා විසින් මැනවැයි පිළිගත් වගීයක රෝග විෂබීජ නසන බෙහෙත්ද සම්පාදනය කිරීම ගැන හා පෙරහැර මඞ්ගල්‍යය පවත්වනතෙක් දවසකට දෙවරක්වත් අශුචි ඉවත්කිරීම හා වැසිකිළි ශුද්ධකිරීම ගැනද හෙතෙම වගකියයුත්තේය. අයිතිකාරයා හෝ බදුකාරයා මෙම නියෝගයේ විධිවිධානවලින් යමක් කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

6. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාව විසින් හෝ පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් හෝ ශරීරකෘත්‍යයන් සඳහා වෙන්කොට තිබෙන ස්ථාන හැර වෙන කිසියම් ස්ථානයක් පෙරහැර මඞ්ගල්‍ය පවත්වන කාලයේදී පාවිච්චිකරන්නාවූ හෝ පහරනලද අශුචි පස්වලින් හෝ වැලිවලින් වසානොදමන්නාවූ යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

7. සියලුම පිදුරු, කැළිකසල, ගොම හෝ වෙනයම් රොඩු ආදිය පෙරහැර මඞ්ගල්‍ය පවත්වන අතර දිනපතා වරක් වත් එකතුකොට ඉවත්කිරීමද, එබඳු කැළිකසල රොඩු ආදිය උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන විසින් මැනවැයි පිළිගන්නාලද ස්ථානයක පුළුස්සාදැමීම හෝ වළලාදැමීම පෙරහැර මඞ්ගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයාට හෝ (එය බද්දට දී තිබේනම්) බදුකාරයාට භාර වැඩකි. මෙම නියෝගයේ විධිවිධානවලින් යමක් නොකොට හෝ නොකරවා පැහැරඅරින යම්කිසි අයිතිකාරයෙක් හෝ බදුකාරයෙක් ඇත්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

8. මාතර සිට තංගල්ලට යන මහපාරේ කානුවේ පටන් අඩි 12ක් ඇතුළත බිමේ පෙරහැර මඞ්ගල්‍යය පිළිබඳව කඩ මඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දෙවුන්දර නොසෑදිය යුතුයි. තවද වෙළඳාම්බඩු මැස්සක් තබාගත් යම්කිසි කෙනකු වෙළෙන්දකු හෝ බුලත් විකුණන්නකු එබඳු බිම ඇතුළත විකිණීම පිණිස බඩු තබාගෙන සිටියයුතු නැත. මේ නියෝග කඩකරන යමෙක් ඇත්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

9. රථවාහනාදිය නැවීමට හෝ මඞ්ගල්‍යය බලන්නට එන්නන්ගේ ඉඩ පහසුවට මාතර උප දිසාපතිතුමා විසින් වෙන් කර තිබෙන යම් බිම් කොටසක් ඇත්ද දෙවුන්දර එබඳු ස්ථානයේ කඩ මඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් තැනිය යුතු නොවේ යම් කිසිවෙක් මේ නියෝගයේ විධිවිධාන කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Kandy No. 136.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1929ක්වූ සැප්තැම්බර් මස 18වෙනි දිනවූ බදාදා පෙරවරු 10.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතහේවාහැට කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 24ක්.

මුල් සිතියමේ නො. 8,024. ගම—හේවාවිස්ස කෝරළේ මාරස්සන.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 322 | කටුගොඩයාය හෝනොහොත් ඇල්ලේහේන | ආණ්ඩුව, මාරස්සන පදිංචි පුංචි අප්පුහාමි සහ තවත් කෙනෙක් | හේන .. | 0 | 0 | 26 | —* |
| 323 | එම .. | එම .. .. | එම .. | 0 | 3 | 10 | 25 |
| 324 | එම .. | ආණ්ඩුව, මාරස්සන පදිංචි ඇස්. ඇම්. උක්කුබන්ඩා සහ තවත් අයවලුන් | එම .. | 1 | 2 | 38 | 25 |
| 325 | කටුගොඩයාය .. | ආණ්ඩුව සහ මාරස්සන පදිංචි අරවේගෙදර කිරිබන්ඩා | එම .. | 0 | 3 | 7 | 25 |
| 326 | එම .. | ආණ්ඩුව, මාරස්සන පදිංචි කුලතුන්ගෙදර හිංගිරිබන්ඩා සහ තවත් අයවලුන් | එම .. | 1 | 1 | 29 | 25 |
| 327 | ගල්ඇල්ලේහේන .. | ආණ්ඩුව සහ උඩුදෙනියේ පදිංචි මිරුස්සා ලෙබ්බේ | එම .. | 0 | 3 | 38 | 25 |
| 328 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 22 | —* |
| 329 | ගල්ඇල්ලේවනාත .. | ආණ්ඩුව, කන්දේවල පදිංචි ඇම්. ඇම්. ලෙබ්බේ සහ ආර්. ඇම්. උක්කුබන්ඩා ආරච්චිල | එම .. | 0 | 0 | 14 | —* |
| 330 | එම .. | ආණ්ඩුව, ආර්. ඇම්. උක්කුබන්ඩා ආරච්චිල සහ මාරස්සන පදිංචි තවත් අයවලුන් | එම .. | 0 | 0 | 17 | —* |
| 331 | කටුගොඩයාය .. | ආණ්ඩුව සහ කන්දේවල පදිංචි රත්තුන්ගෙදර උක්කුබන්ඩා ආරච්චිල | එම .. | 0 | 0 | 15 | —* |
| 332 | එම .. | එම .. .. | එම .. | 0 | 2 | 11 | 25 |
| 333 | එම .. | ආණ්ඩුව සහ මාරස්සන පදිංචි රත්නායක මුදියන්සේලාගේ මුතුමැනිකා | හේන .. | 0 | 2 | 32 | 25 |
| 334 | එම .. | ආණ්ඩුව, කන්දේවල පදිංචි ආර්. ඇම්. උක්කුබන්ඩා ආරච්චිල සහ තවත් කෙනෙක් | එම .. | 0 | 3 | 12 | 25 |
| 335 | එම .. | ආණ්ඩුව, මාරස්සන පදිංචි දිසානායකමුදියන්සෙලාගේ මුතුබන්ඩා සහ තව අයවලුන් | එම .. | 0 | 1 | 13 | 25 |
| 336 | බෝගහකුඹුරහේන .. | ආණ්ඩුව, මාරස්සන පදිංචි සමරකෝන්මුදියන්සේලගේ පිංහාමි සහ තවත් අයවලුන් | හේන අවුරුදු 4ක් වයස ඇති පොල්ගස් 2ක් සහ අවුරුදු 2ක් වයස ඇති පුවක්ගහක් තිබේ | 1 | 0 | 31 | 25 |
| 337 | කටුගොඩයාය .. | ආණ්ඩුව සහ මාරස්සන පදින්චි පල්ලේසැද්දුම්මේගෙදර මුතුමැනිකා | හේන .. | 0 | 3 | 4 | 25 |
| 338 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 7 | —* |

| නො. | ඉඩමේ නම. | අයිතිකම කියන්නා. | අන්දම. | මහත, අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 339 | කටුගොඩයාය .. | ආණ්ඩුව සහ මාරස්සන පදිංචි ඇම් ඩී. එච්. අබේකෝන් | හේන .. | 0 | 0 | 12 | —* |
| 340 | එම .. | එම .. .. | එම .. | 0 | 3 | 27 | 25 |
| 341 | එම .. | ආණ්ඩුව, වික්‍රමසිංහ ගුරුවරයා සහ මාරස්සන පදිංචි තවත් කෙනෙක් | එම .. | 1 | 1 | 25 | 25 |
| 342 | එම .. | ආණ්ඩුව සහ මාරස්සන පදිංචි ආර්. ඇම්. කිරිබණ්ඩා | එම .. | 0 | 2 | 34 | 25 |
| 343 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 6 | —* |
| 344 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 10 | —* |
| 345 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 23 | 25 |

* නොවිකුණා ඉතුරු කරනු ලැබේ

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ ලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්ජ. ජී. ටිරල්,
වැඩබලන මහ ලේකම්තුමා වෙනුවෙන්

---

ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1929ක්වූ ජූලි මස 30වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1.45ට බදුළු කච්චේරියේදී මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉල්ලුම්කාර ඉඩම් නැති ගම්වාසීන්ට කටුසරභෝග වවාගැනීමට අවුරුදු 99කට බදුදෙන්ට යෙදෙනවා ඇත.

1. බදුකාරයා විසින් හැම අවුරුදුවලම ජනවාරි මස 1වෙනි දින එක එක බිම්කොටසට නියමකරතිබෙන මුල්මුදල (ප්‍රිමියම් මුදල) පහට බෙදූ අවුරුද්දකට කොටසක් බැගින් අවුරුදු පහකට ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේට බදුළු කච්චේරියේදී ගෙවන්ට ඕනෑය.

2. මීටපසු අවුරුද්දකට ශත දහය ගණනේ හැම අවුරුදුවලම ජනවාරි මාසේ පළමුවෙනි දිනට ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේට බදුළු කච්චේරියේදී ගෙවන්ට ඕනෑය.

3 බදු දුන්අයගේ කැමැත්ත නැතුව මෙම ඉඩම් උකස්කරන්ට හෝ සින්නක්කරයක් දෙන්ට හෝ බද්ද වෙන කෙනෙකුට පවරන්ට හෝ නුපුළුවන.

මෙම ඉඩම්වල බද්දේ වැඩිදුර කොන්දේසි ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

ඌව දිසාවේ බදුළු පලාතේ උඩුකිඳ, වැල්ලවාය සහ යටිකිඳ කෝරළවල පිහිටා තිබෙන බිම්කෑලි 15ක්.

මුල් සිතියමේ නො. 2,638. ගම—මැදපලාතකෝරළේ ඇත්කඳවකගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | මැදහීන්නේපතන .. | ජී. උක්කුබණ්ඩා .. .. | අලුත එළිකරපු ඉඩම | 2 | 1 | 7 | 85 |
| 7 | එම .. | — .. .. | එම .. | 3 | 3 | 6 | 85 |

මුල් සිතියමේ නො. 2,663. ගම—දඹවිනිපලාතකෝරළේ ගලහිටියාවේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | දිඹුල්ගහපතන .. | ඩී. මැනිකා .. .. | හේන .. | 1 | 3 | 21 | 85 |

මුල් සිතියමේ නො. 2,713. ගම—වැල්ලවායකෝරළේ වීරසේකරගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | දෙහිලන්දේයාය .. | ආර්. ඇම්. අප්පු .. .. | හේන .. | 4 | 2 | 15 | 55 |

අන්තිම සිතියමේ නො. 93. ගම—බෝගොඩකෝරළේ කැටවලගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1w | ගොරඩියපතන නොහොත් වැවේපතන | ඇම්. ඩී. කරෝලිස් අප්පුහාමි .. | පතන .. | 3 | 0 | 7 | 50 |
| 1x | වේවැල්කුඹුරේහේන .. | එම .. .. | එම .. | 1 | 0 | 6 | 50 |
| 1z | එම .. | එම .. | පතන සහ හේන | 1 | 2 | 22 | 50 |
| 3o12 | කැටහුරුගොඩපතන .. | ආර්. ආර්. ඇම. තිසාහාමි .. | පතන .. | 1 | 0 | 19 | 50 |
| 3o14 | ඉලුක්වත්ත නොහොත් අගල කැපුවත්තේපතන | ආර්. ඕංගිරිමැනිකා .. .. | හේන .. | 1 | 0 | 7 | 50 |
| 3o15 | අගලකපුවත්තේපතන .. | ආර්. ඇම්. සියාතු .. .. | එම .. | 1 | 0 | 0 | 50 |
| 3o19 | ගල්කඳුරේහේන .. | ජේම්ස්අප්පු .. .. | එම .. | 2 | 0 | 28 | 50 |
| 3o20 | ඉලුක්තැන්න .. | ආර්. ආර්. ඇම්. උක්කුබන්ඩා .. | පතන .. | 0 | 3 | 36 | 50 |
| 3o23 | ගොරඩියපතන නොහොත් උඩු මුකලානේපතන | ඩී. ඇම්. පුංචිබන්ඩා .. .. | එම .. | 1 | 0 | 15 | 50 |
| 3o27 | බුලුගහමුල්ලේවත්ත .. | ආර් ආර්. ඇම්. කොර්නේලිස් අප්පුහාමි. | වත්ත .. | 0 | 2 | 3 | 50 |

අන්තිම ගම් සිතියමේ නො. 189. ගම—දඹවිනිපලාතකෝරළේ ගුරුතලාවේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම | මහත. අ. | ර. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3w | මහතැන්නේපාඩුලපතන .. | කේ. ඇම්. සඩිඳු .. .. | වත්ත .. | 1 | 1 | 5 | 85 |

වර්ෂ 1929ක්වූ ජූනි මස 12වෙනි දින කොළඹ
මහ ලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්ජ. ජී. ටිරල්,
වැඩබලන මහ ලේකම්තුමා වෙනුවෙන්

**No. 9,059, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1929ක්වූ අගෝස්තු මස 22වෙනි දිනවූ බෘහස්පතින්ද පෙරවරු 9ට තිස්සමහාරාමේ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 12ක්.

ටෝපෝ මූල් සිතියමේ නො. 2. (කොටස 6) ගම—කිරින්ද.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1A | සියඹලාගහවත්ත .. | ආණ්ඩුව, නැසීගිය සාහිබ් බ්‍රාහිම් විසින් ඉල්ලුම්කර තිබේ (සෑවී සම්සි මූරියන්) | ලඳුකැලය .. | 0 | 1 | 33 |
| 1D | එම .. | ආණ්ඩුව, (1) දුනී ජරි පැකෝන්, (2) සෙයිනුදීන් පූසනා, (3) දෙලන් අම්ජදීන් විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 0 | 0 | 39 |
| 1E | දළුක්විත්න .. | ආණ්ඩුව, (1) ඊබ්‍රහිම් කාසිම්, (2) මානි සහිදි, (3) ජසුන්දීන් කාරීම්, (4) අබොහමීම් මගෝන්, (5) ඔමළු මරික්කාර් සලි අම්මා විසින් ඉල්ලුම්කර තිබේ | මුඩුබිම .. | 0 | 0 | 20 |
| 1F | එම .. | ආණ්ඩුව, බබා ජමී දූල් විසින් ඉල්ලුම්කර තිබේ .. | එම .. | 0 | 2 | 0 |
| 1I | කොලන්මිනතු .. | ආණ්ඩුව, මොහමද් හසීම් තලිප් විසින් ඉල්ලුම්කර තිබේ .. | ලඳුකැලය .. | 0 | 2 | 0 |
| 1J | එම .. | ආණ්ඩුව, සාහිබ් බ්‍රාහිම් තහිරීන් විසින් ඉල්ලුම්කර තිබේ .. | වම .. | 0 | 2 | 0 |
| 1K | එම .. | ආණ්ඩුව, ඔමරු සෙයිනුදීන් විසින් ඉල්ලුම්කර තිබේ .. | එම .. | 0 | 2 | 0 |
| 1L | එම .. | ආණ්ඩුව, උදුමාල මරික්කාර් අබ්දුල් හමීඩ් විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 0 | 2 | 0 |
| 1C | මලිනන්ගහඉඩම් .. | ආණ්ඩුව, අම්ජමගුන්ගේ වගාව .. .. | වත්ත .. | 0 | 0 | ·5 |
| 6C | සූරියගහවත්ත .. | ආණ්ඩුව, නාසීම් පූසානා සහ ඉසි මරික්කාර් සායිබූ තජදීන් විසින් ඉල්ලුම්කර තිබේ | මුඩුබිම .. | 0 | 0 | 19 |
| 6D | දළුක්විත්න .. | ආණ්ඩුව, (1) ඊබ්‍රහසිම් කාසිම්, (2) මානි සහිදි, (3) ජසුන්දීන් කාරිම්, (4) අබිහාමිම් මගුන්, (5) ඔමළු මරික්කාර් සාලිඅම්මා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 0 | 0 | 19 |

ටෝපෝ මූල් සිතියමේ නො. 2. (කොටස 1) ගම—කිරින්ද.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 30 | කුල්ලන්ඕතෝටම් .. | ආණ්ඩුව, කිරින්දේ පදිංචිව සිටි (දැනට හම්බන්තොට පදිංචි) ඒ. කේ. දූල් විසින් ඉල්ලුම්කර තිබේ | පඳුරු කැලය. | 2 | 1 | 13·1 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16යේ සිට රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහාසක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වැඩබලන මහ සෙක්‍රතාරිස් වම්හ.

---

**No. 9,060, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1929ක්වූ අගෝසතු මස 21වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට තිස්සමහාරාම කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 13ක්.

ලංකාමැනීමේ මූල් සිතියමේ නො. 633. ගම—රනකෙලිය දකුණ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 164 | මහගල්වලකනත්ත .. | ආණ්ඩුව, මාගම පදිංචි දෙන් අන්‍රිස් ජයවර්ධන විසින් ඉල්ලුම්කර තිබේ | හේන .. | 1 | 3 | 39 |
| 169 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි හක්මන නැකතිගේ බබියසා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 2 | 0 | 20 |
| 170 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි තන්ගල්ලේ ගනිතගේ රෙටා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 2 | 0 | 24 |
| 171 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි කදිමවාරිගේ සලෝ විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 2 | 0 | 8 |
| 177 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි වඩුාබරනගනිතගේ බබයා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 1 | 0 | 2 |
| 179 | එම .. | ආණ්ඩුව, සිරිජයලත් විජේරත්ජන් ජෝතිරත්න අන්දිසා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 0 | 3 | 37 |
| 180 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි ජෝතිරත්නගමගේ හිංගිබබා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 1 | 0 | 1 |
| 181 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි වැපොතඉරනැකතිගේ අමරිස විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 1 | 0 | 1 |
| 182 | එම .. | ආණ්ඩුව, මාගම පදිංචි තන්ගල්ලේ ගනිතගේ එලෙජරිසා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 1 | 0 | 1 |
| 161 | එම .. | ආණ්ඩුව, හම්බන්තොට කඩවිදියේ ඇම්. බී. චාර්ලිස් ද සිල්වා විසින් ඉල්ලුම්කර තිබේ | එම .. | 5 | 0 | 34 |
| 158 | එම .. | එම .. .. .. | එම .. | 1 | 2 | 37 |
| 61 | පතිරත්නවෙල .. | ආණ්ඩුව, ජිනදාස පතිරත්නගේ වගාව .. .. | කුඹුර .. | 2 | 0 | 32* |
| 61A | බාවාගේවෙල .. | ආණ්ඩුව, හම්බන්තොට පදිංචි සාජීන් බාවා සහ සායිඩ් අලි මච්ලාහාගේ වගාව | එම .. | 1 | 3 | 11* |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රු. 16 සිට රු. 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වැඩබලන මහ සෙක්‍රතාරිස් වම්හ.

**No. 9,061, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1929ක්වූ අගෝස්තු මස 21වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට තිස්සමහාරාමයේ තානායමේදී බදුදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 632. ගම—හල්මිල්ලෑව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 20 | විජේසූරියකුඹුර .. | ආණ්ඩුව, නුපේ පදිංචි බාලසූරිය අනෝහාමිගේ වගාව .. | කුඹුර .. | 1 2 13 |
| 31 | අන්දරගස්යායේකුඹුර .. | ආණ්ඩුව, ජේ. එච්. බහාර් මුදලිතැනගේ සහ බූරගේ වගාව .. | එම .. | 2 3 9 |

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. විරල්,
වැඩබලන මහ සෙක්‍රතාරිස් වර්හ.

---

**No. 9,062, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1929ක්වූ අගොස්තු මස 21වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට තිස්සමහාරාමයේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 636. ගම—මාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 119 | තොටුපලගාවවත්ත .. | අදම්බාවාගේ කනවැන්දුම් ස්ත්‍රී වන මෙයිසාදීන් බාවා .. | වත්ත .. | 1 1 0 |
| 49 | මූලන .. | ආණ්ඩුව, හම්බන්තොට පදිංචි පුංචිහේවාගේ මැන්දිස් ද සිල්වා විසින් හිගමුදල් ගෙවානැත | කුඹුර .. | 0 1 38 |
| 50 | එම .. | එම .. .. .. | එම .. | 4 0 9 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. විරල්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වර්හ.

---

**No. 9,063, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1929ක්වූ අගෝස්තු මස 21වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට තිස්සමහාරාමයේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 626. ගම—මහඅකුරුගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 22A | වැලිආරේගොඩන .. | දකුණු තිහගේ පදිංචි සිතබදුගේ සියෙඩු අප්පු විසින් හිග මුදල් ගෙවානැත | ලඳුකැලය .. | 1 2 37 |
| 55 | මහඅකුරුගොඩගොඩන | වණිගබදුගේ පොඩිසියෙඩු විසින් හිගමුදල් ගෙවානැත .. | වත්ත .. | 0 1 25 |
| 78 | එම .. | සූරියපටබැදිගේ පිනෙස්හාමි විසින් හිගමුදල් ගෙවානැත .. | එම .. | 0 2 0 |
| 80 | එම .. | එම .. .. .. | එම .. | 1 2 18 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 16 සිට රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. විරල්,
වැඩබලන මහ සෙක්‍රතාරිස් වර්හ.

---

**No. 9,064, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1929ක්වූ ජූලි මස 31වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට පුස්සැල්ලේ වැඩදෙපාර්තමේන්තුවේ බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ කුරුවිටකෝරලේ දකුණු උඩපත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 226. ගම—තැඹිලියාන.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 112 | පැරඩයිස්වත්ත .. | ආණ්ඩුව, ඇල්. ඩබ්ලිව්. ඒ. ද සොයිසාගේ වගාව .. | රබර් .. | 0 1 24 |
| 114 | එම .. | එම .. .. .. | එම .. | 0 2 1 |
| 115 | වත්තේපාර .. | ආණ්ඩුව .. .. .. | පාර .. | 1 0 22 |
| 35½ | වැලිඔවිට .. | ආණ්ඩුව, කේ. ඩී. හෙන්ද්‍රික් සහ තවත් අයවළුන්ගේ වගාව .. | වතත සහ ගෙයක කොටසක් | 0 0 5* |

* බදු දීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 50 සිට රුපියල් 150 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 10වෙනි දින කොළඹ
මහ සෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඇෆ්. ජී. විරල්,
වැඩබලන මහ සෙක්‍රතාරිස් වර්හ.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

ශ්‍රෙෂ්ඨාධිකරණ මන්ත්‍රණ සභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපණතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා, එනම්, හැව්ලොක් පාරේ සහ ලොරිස් පාරේ මංසන්ධිය පලල්කිරීම පිණිස උවමනා බැවින් ඒ ඉඩම යුතු ප්‍රකාර අයිතිකරගැණීමට මම විසින් අණ ලබනලදී, ඒ ඉඩමනම්:—

ප්‍රාරම්භ පැලෑන නො. 19,718. ගම—බම්බලපිටිය

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම කියාසිටින අයගේ නම. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හැව්ලොක් පාරේ වරිපණම් නො. 8 දරණ "ලින්විල්" | අවුරුදු 2ක් පමණ වයසැති රටදෙල්ගසක්ද, මල්වත්තක් සහ හුණුනත් බදිනලද තාප්ප කෑලි දෙකක්ද ඇති වත්ත | කැලරන්ස් ද වොස් නෝනා මහත්මි | 0 0 0·5 |

ඒනිසා එකී ආඥාපණතේ 7වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහතකී ඉඩම අයිතිකරගැණීමට අදහස්කරණ බැව් මෙයින් ප්‍රකාශකරමි.

තවද එකී ඉඩම ගැණ සැලකිමක් ඇති සියලුදෙනාම, ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද, ඉඩම ගැණ වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද පෙන්වාසිටින පිණිස ඒවට අයිති ඔප්පුද, රෙජිස්ටර් පොතේ කොපියක්ද රැගෙණ තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය හෝ වර්ෂ 1929ක්වූ ජූලි මස 11වෙනි දින පෙරවරු 10.30ට කොළඹ නාගරිකසභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1929ක්වූ ජූනි මස 6වෙනි දින
කොළඹ නාගරිකසභා කන්තෝරුවේදිය.

එච්. ඊ. නියුන්හැම්,
කොළඹ නාගරිකසභාවේ සභාපතිතැන සහ නගරාධිපතිතුමා.

---

ශ්‍රෙෂ්ඨාධිකරණ මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපණතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකාරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා, එනම්, ප්‍රසිද්ධ බෙහෙත් සාලාවකට උවමනා බැවින් ඒ ඉඩම් යුතුප්‍රකාර අයිතිකරගැණීමට මම විසින් අණලබනලදී, ඒ ඉඩම්නම් :—

ප්‍රාරම්භ පලෑන නො. 19,756. ගම—කොම්පොඤ්ඤවීදිය.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම කියාසිටින අයගේ නම. | විශාලකම. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ජැනරල්ස් ලේක් රෝඩ් පාරේ වරිපනම් නො 3 දරණ ඉඩම | මුඩුබිම | ඒ. රාමසාමි රෙඩ්ඩියාර් | 0 1 18·82 |
| 2 | එම | එම | ආණ්ඩුව | 0 0 6·77 |
| 3 | එම | එම | ඒ. රාමසාමි රෙඩ්ඩියාර් | 0 0 7·74 |
| | | | | 0 1 33·33 |

ඒ නිසා එකී ආඥාපණතේ 7වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහතකී ඉඩම් අයිතිකරගැණීමට අදහස්කරණ බැව් මෙයින් ප්‍රකාශකරමි.

තවද එකී ඉඩම් ගැණ සැලකිමක් ඇති සියලුදෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද, ඊට අයිති ඔප්පුද රෙජිස්ටර් පොතේ කොපියක්ද, රැගෙණ ඉඩම් ගැණ වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද, පෙන්වාසිටින පිණිස තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය හෝ වර්ෂ 1929ක්වූ ජූලි මස 11වෙනි බෘහස්පතින්දා පෙරවරු 10ට කොළඹ නාගරිකසභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1929ක්වූ ජූනි මස 6වෙනි දින
කොළඹ නාගරිකසභා කන්තෝරුවේදිය.

එච්. ඊ. නියුන්හැම්,
කොළඹ නාගරිකසභාවේ සභාපතිතැන සහ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—මීගමුවේ පිහිටි ආණ්ඩුවේ දෙමළ පාඨශාලාවට යෑමට පාරක් ඇතිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙන් කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. 19,595. ගම—හුණුපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහවත්ත නොහොත් නාගරයාගෙවත්ත (වරිපණම් නො. 59 සහ 60) | පොල්ගස් 4ක්, පොල්පැල 4ක් සහ කොස්ගස් දෙකකින්යුත් පොල්ඉඩම | දෙන තියදොරුහාමි සහ පී. ඇස්. පෙරේරා | 0 0 21·75 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1929ක්වූ ජූලි මස 26වෙනි දින පස්වරු 1.30යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිසිවූ අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටිනාවූ මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1929ක්වූ ජූනි මස 11වෙනි දින
කොළඹ කච්චේරියේදිය.

කේ. සෝමසුන්දරම්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සුළුපාරක් විවෘතකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් හිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 19,733. ගම—මීගමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අංක 36 දරණ ඉඩම හැන්ව් ස්ට්‍රීට්වීදිය | පොල්පැලයකින් යුත් පොල්ඉඩම .. | ඇම්. ඇස්. ප්‍රනාන්දු .. | 0 0 0·12 |
| 2 | එම .. | පොල්ගසක් සහ පොල්පැලයකින් යුත් පොල්ඉඩම | එම .. | 0 0 0·45 |
| 4 | එම .. | පොල්පැල දෙකෙකින් යුත් පොල්ඉඩම .. | එම .. | 0 0 1 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1929ක්වූ ජූලි මස 26වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ වාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1929ක්වූ ජූනි මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. සෝමසුන්දරම්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වවුනියා දිස්ත්‍රික්කයේ ඕමන්තෙ යන ගමේ බෙහෙත් ශාලාවක්ද එය බාරකාර වෙද්‍යවාසීස්ථානයට නැවතීම පිණිස ගෘහයක්ද සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් හිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො 7,495. ගම—ඕමන්තෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පුලියඩික්කානි .. | මුඩුබිම .. .. | වට්ටක්කෝච්චෙට පදිංචි සින්නප්පා සිවගුරුනාතර්, සින්නප්පා කනගරත්නම් සහ තවත් දෙදෙනෙක් | 0 0 26 |
| 2 | එම .. | මුඩුබිම, අවුරුදු 3ක් වයසැති දෙහිගහක්, අවුරුදු 60ක් වයසැති සියඹලාගස් 3ක්ද තිබේ | එම .. .. | 1 1 22·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරණ තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1929ක්වූ අගෝස්තු මස 10වෙනි දින උදේ 11යේ කනිසමට ඕමන්තෙ ආණ්ඩුවේ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1929ක්වූ ජූනි මස 5වෙනි දින මුල්ලේද්දූවේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
මුල්ලේද්දූවේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—යටියන්තොට ඔස්කඩයකට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් හිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 3,933. ගම—යටියන්තොට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අලවත්තේඔවිට (නො. 48) .. | හිස්ඉඩම, කඩයක් තිබේ .. | ඇම්. ජී. පෙරේරා .. | 0 0 8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1929ක්වූ ජූලි මස 5වෙනි දින පෙරවරු 10.30යේ කනිසමට කිතුල්ගලදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1929ක්වූ ජූනි මස 5වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම් නො. 10,161.]

වර්ෂ 1929ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897කේ 1899යේ 1900යේ 1903යේ සහ 1927යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රිශ්වරයාණන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇම්. කේ. වී. සෑන්ඩ්ස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රිශ්වරයාණන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇම්. කේ. වී. සෑන්ඩ්ස්,
විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් නිරවුල්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ උතුරු යටිකහකෝරලේ දුනුකෙයාවතත යන ගම පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

ලංකාමැනීමේ මුල් සිතියම 2,216.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|
| 8 | .. | සුඑපාර සහ ඉතුරුකර තිබෙන බිම .. .. .. | 1 2 22 |
| 8c | .. | ඇහැටුගහකුඹුරෙපිල්ලැව (සුඑපාර දිගේ ඉතුරුකර තිබෙන බිමෙන් වැඩිපුර අල්ලා ගෙන තිබෙන කොටස) .. .. .. .. | 0 0 6 |
| 8G | .. | තිඹිරිගහමුලවතත ( එම ) .. .. | 0 0 7 |
| | | | 1 2 35 |

මීට මායිම්—උතුරට අකරවත්ත යන ගම ගම්ඉමද (මූනමල්දෙනියේ සිට කටුපොතට යන සුළු පාරක කොටසක්); නැගෙණහිරට මල්වානෙහෙදර යන ගම ගම්ඉමද; දකුණට මාදන්ගහමුලවත්ත (389,716 පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම), බාලසූරියමුදියන්සෙලාගේ අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකමකියන දන්ගහමුලහේන්යාය, හෙට්ටිආරච්චිගෙ පොඩිසිංඤෝ විසින් අයිතිවාසිකම්කියන තිඹිරිගහමුලවත්තද ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන තිඹිරිගහමුලවතතද, ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන දන්ගහමුලවත්තද, බක්මීගහකුඹුර (ප්‍රවේනි), බක්මීගහපිටුව (389,524 පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන බක්මීගහකුඹුරෙපිල්ලැවද, ඇහැටුගහකුඹුරෙපිල්ලැවද (389,813 පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම), බාලසූරියමුදියන්සෙලාගෙ මැනික්හාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන මාදන්ගහමුලවත්තද, ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන මාදන්ගහමුලවත්තද, ගම්සභාපාරද, ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන හූරිගහමුලවත්තද, හෙට්ටිආරච්චිගෙ පොඩිසිංඤෝ සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන හූරිගහමුලවත්තද, මාදම්පේ පදිංචි සූසෙහේවගෙ බන්දේරිස් ප්‍රනාන්දු විසින් අයිතිවාසිකම්කියන කහටගහමුලවත්තද, අදිකාරීමුදියන්සෙලාගෙ පීරිස් අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන පන්වලහේන්යායද, ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන කෝන්ගහමුල මිනිපිටියද, අදිකාරීමුදියන්සෙලාගෙ පීරිස් අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන පන්වලහේන්යාය ; බස්නාහිරට මූනමල්දෙනිය යන ගම ගම්ඉමද.

[කුරුණෑගල මි. ම. 44—1929.]

---

[අනුරාධපුර දැන්වීම් නො. 10,162.]

වර්ෂ 1929ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897කේ, 1899යේ, 1900යේ, 1903යේ සහ 1927යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ලයිව් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ලයිව්,
විශේෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් නිරවුල්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාසේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිම හැටියට භාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

උතුරු මැද්දම දිසාවේ කලාගම් පලාතේ කිරලෝවකෝරලේ දුනුමඩලබයදූලතුලානේ මූරුංගාහිටිකන්ද යන ගම පිහිටා තිබෙන බිම්කට්ටි :—

ලංකාමැනීමේ මුල් සිතියම 1,133.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|
| 1 | .. | ඉගිනිගස්යාය .. .. .. .. | 2 0 10 |
| 2 | .. | අඩිපාර .. .. .. .. | 0 0 7 |

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 3 | කොලොන්ගස්හේන | | 3 | 0 | 1 |
| 4 | එම | (මිනිපිට්ටනියට යන පාර) | 0 | 0 | 28 |
| 5 | මිනිපිට්ටනිය | | 0 | 2 | 13 |
| 6 | වරයායෙහේන, වරහේන, උල්පොත්හේන, වැව්ඉහලයාය | | 100 | 1 | 13 |
| 7 | මූරුංගාහිටිකන්දවැව (වැව සහ කන්ඩිය) | | 24 | 2 | 31 |
| 8 | වැව්පාවුලහේන, හෙලඹගහහේන | (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) | 3 | 3 | 17 |
| 9 | හොරෙවිඇල | | 0 | 0 | 18 |
| 16 | ගන්ගොඩහේන (තිස්බඹ) | | 2 | 1 | 39 |
| 23 | වැව්පාවුලහේන | | 4 | 0 | 0 |
| 24 | ගලමූල්ලේහේන | | 0 | 2 | 8 |
| 26 | මීගහහේන | | 5 | 3 | 38 |
| 27 | මහගල | | 35 | 2 | 10 |
| | | | 183 | 1 | 33 |

මීට මායිම්—උතුරට පල්ලෙහිගුර යන ගම ගම්ඉමද, උඩහිගුර යන ගම ගම්ඉමද (දකුණු කලාගම්කෝරළේ මායිමද); නැගෙණහිරට කොටගල යන ගම්ඉමද; දකුණට නැල්බෙගෑව යන ගම ගම්ඉමද; බස්නාහිරට ඉහලගම යන ගම ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දන්විමෙන් අත්හැරියවගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 23 රූඩ් 3 පර්චස් 32ක ඉහතකී අක්කර 183 රූඩ් 1 පර්චස් 33ගේ බිම්තරමේ අඩංගුනොවන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මුල් සිතියම 1,133.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 10 | කුඹුරුඅක්කරෙ (හොරෙව්ඇලදිගේ ඉතුරුකර තිබෙන බිම) | 0 | 0 | 37 |
| 11 | එම (392,005ගේ පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩමෙන් කොටසක්) | 1 | 0 | 11 |
| 12 | එම ( එම ) | 0 | 0 | 33 |
| 13 | එම ( එම ) | 0 | 1 | 12 |
| 14 | එම ( එම ) | 1 | 2 | 8 |
| 15 | ඉහලවෙල, පහලවෙල | 14 | 2 | 39 |
| 17 | කොස්ගහගෙදර, අඹගහගෙදර | 2 | 3 | 28 |
| 18 | ගෙදරහේන (තිස්බඹ) | 0 | 1 | 21 |
| 19 | උල්පතෙවෙල්කොටුව | 0 | 1 | 20 |
| 20 | වෙලපාවුලහේන | 0 | 3 | 8 |
| 21 | පාළුවත්ත | 0 | 3 | 32 |
| 22 | ඇල (වේලුන) | 0 | 0 | 23 |
| 25 | දේවාලවත්ත | 0 | 1 | 0 |
| | | 23 | 3 | 32 |

[අනුරාධපුර වි. ම. 11—1929.]

---

[අනුරාධපුර දැන්වීම නො. 10,163.]

මේ 1929ක්වූ ජූනි මස 14වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897ගේ, 1899ගේ, 1900ගේ, 1903ගේ සහ 1927ගේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ලයිව් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපූ එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජයන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ලයිව්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිම හැටියට භාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ කලාගම්පලාතේ කිරලවකෝරලේ දුනුමඩලබයදෙලතුලාගෙ කොඩිකාරගම යන ගම පිහිටා තිබෙන බිම්කට්ටි :—

ලංකාමැනීමේ මුල් සිතියම 1,145.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | කොඩිකාරගමකැලේ | 10 | 3 | 17 |
| 2 | වන්ඇල (වතුරපාර සහ කන්ඩිය) | 0 | 3 | 12 |
| 3 | කොඩිකාරගමකැලේ | 1 | 2 | 0 |
| 5 | එම සහ දඹගහයාය | 20 | 1 | 16 |
| 6 | කොඩිකාරගමවැව (වැව සහ කන්ඩිය) | 26 | 3 | 38 |
| 7 | මහපාර (හරිකොටසක්) | 1 | 2 | 13 |
| 8 | සියඹලාගහහේන (පාර දිගේ ඉතුරුකර තිබෙන බිම) | 0 | 3 | 17 |
| 10 | වෑකන්දෙපිල්ලෑව, වෑකන්දපාවුල (වැව් කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) | 3 | 3 | 3 |
| 11 | ගල්ගොඩහේන | 4 | 0 | 11 |
| 13 | මහපාර | 0 | 1 | 34 |
| 14 | හෙම්බියාවැවෙවත්ත (පාරදිගේ ඉතුරුකර තිබෙන බිම) | 0 | 0 | 23 |
| 17 | එම | 2 | 2 | 35 |
| 18 | පාළුවෑකන්ද (වැව්කන්ඩිය) අත්හැරතිබෙන | 0 | 0 | 8 |
| | | 74 | 0 | 27 |

මීට මායිම්—උතුරට ඔබතුගමකඩවීදිය යන ගම ගම්ඉමද; නැගෙණහිරට ඉහලබක්මීගහඋල්පොත යන ගම ගම් ඉමෙන් කොටසක්, බක්මීගහඋල්පොත යන ගමේ ගම්ඉමද; දකුණට බක්මීගහඋල්පොත සහ හෙවනතැන්නෙගම යන ගම්වල ගම්ඉම්ද; බස්නාහිරට දුනුමඩලාව යන ගම ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමෙන් අත්හැරීය වගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 57 රූඩ් 1 පර්චස් 32ක ඉහතකී අක්කර 74 පර්චස් 27යෙන් බිම්තරයේ අඩංගුනොවන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මුල් සිතියම 1,145.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 4 | .. | පාළුවත්ත (361,335යේ පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) .. .. | 3 | 0 | 16 |
| 9 | .. | කොඩිකාරගමතැලේ, අළුත්වෙල, ගන්ගොඩවත්ත (373 560, 361,336, 375,494යේ පිඹුරුකඩදාසිවල පෙනීයන ඉඩම් සහ 365,598යේ සහ 373,559යේ පිඹුරුකඩදාසිවල පෙනීයන ඉඩම්වලින් කොටස්) .. .. .. | 23 | 2 | 38 |
| 12 | .. | පුරාණවෙල (365,598යේ සහ 373,559යේ පිඹුරුකඩදාසිවල පෙනීයන ඉඩම්වලින් කොටස් ඇතුලත්වේ) .. .. .. .. | 26 | 2 | 23 |
| 15 | .. | හෙට්ටියාවැවේවත්ත (373,558යේ පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම) .. | 3 | 3 | 21 |
| 16 | .. | වෙල්ඇල (වතුරපාර) වේළුන .. .. .. .. | 0 | 0 | 14 |
| | | | 57 | 1 | 32 |

[අනුරාධපුර වී. ම. 12—1929.]

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

වර්ෂ 1929ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1930ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනෙන් අවසාන මාස කාලයට මෙහි පහත සඳහන්වෙන බස්නාහිර පලාතේ පාලම් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන මැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1929ක්වූ ජූලි මස 10වෙනි බදාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ.

මෙහි පහත දක්වන එක එක රේන්දයට වෙන වෙනම මැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් දොළොස් මාසයක ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්නට යෙදුනොත්නම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන් වහන්සේ විසින් ඒත්තුගත්බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුලතදී 12 මාසයකට ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්නට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකරීම සඳහා ආණ්ඩුවේ පෙරකදෝරු මහත්වරුන්ට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකරීමට, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රෙජිස්තර්කිරීමටද, වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත අන්දමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපෙකට නොහොත් උකසකට යටත් නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරියයුතුයි.

මේ ගැන වැඩිදුර කාරණ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

### ප්‍රධාන පාරවල්වල පාලම් රේන්ද.

#### නගරයට අයිති පාලම්.

1. (*a*) පස්බිසාල් නමැති තොටුපල (වත්තල).
   (*b*) උඩඅදින පාලමේ ඇලරේන්දය (ග්‍රෑන්ඩ්පාස්).
2. මෝදර තොටුපල් රේන්දය.

### ප්‍රධාන පාරවල් නොවන පාලම් රේන්ද.

#### A.—කොළඹ දිස්ත්‍රික්කුවේ.

1. හැදල සහ පමුනුගම තිබෙන හැදල ඇලරේන්දය, හොරකගහතොටුපලේ සහ ජේසප්ගේ ඇල කියන ඇලට ජර 642ක් උතුරෙන් පමුණුගම පරණ මීගමු ඇලේ බස්නාහිර පැත්තේ ඉවුරේ ස්ථානයක තිබෙන හැදල ඇලරේන්ද.
2. කින්නන්පඩුවේ ඇලරේන්දය.

අයකරන ස්ථාන.—දෙමටගොඩ ලොක්ගේට්ටුවේ සහ අත් තිඹිරියේ එක රේන්දපලකට ගෙවීමට අනික් රේන්දපලෙන් පසුවදා නිදහස්ව යන්ට පුළුවන.

#### B.—මීගමු දිස්ත්‍රික්කුවේ.

පලාන්සේන පාලම සමීපයේ තිබෙන මීගමුඇලේ රේන්දය. රේගුවපාරේ ඇල දෙරටුවෙහි පාලමේ මීගමු ඇලේ රේන්දය. එක රේන්දපලකට ගෙවීමට අනිත් රේන්දපලෙන් නිදහස්ව යන්ට පුළුවන.

#### C.—කළුතර දිස්ත්‍රික්කුවේ.

(*a*) කළුතර පරණ ඇලේ කැපූ ඇලමෝදර තිබෙන රේන්දය සහ ගල්තුඩේ රේන්ද, එක රේන්දපලකට ගෙවීමට අනිත් රේන්දපලෙන් නිදහස්ව යන්ට පුළුවන.

(*b*) කළුතර අළුත්ඇලේ හතරමෝදර රේන්ද.

ජේ. ඩී. මිලින්ටන්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 7වෙනි
දින කොළඹ කච්චේරියේදිය.

## රාගම ආරෝග්‍යශාලාව පිහිටි ඉඩමේ තිබෙන ගස්වල බද්ද.

රාගම ආරෝග්‍යශාලාව පිහිටි ඉඩමේ ආරෝග්‍යශාලාවට අයිති හරිය සහ වෛද්‍ය නිලධාරීතැන පදිංචි බංගලාවට අයත් කටු කම්බිගසා වෙන්කරනලද හරියෙන් තිබෙන ගස් අත්හැර ඉතිරි ඉඩමේ තිබෙන ගස් වර්ෂ 1929ක්වූ ජූලි මස 1වෙනි දින සිට අවුරුදු 5කට මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බදුගැනීම පිණිස එවනුලබන සීල් තබනලද ඉල්ලුම් පත්‍ර බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

යථෝක්ත ඉල්ලුම්පත්‍ර වර්ෂ 1929ක්වූ ජූනි මස 27වෙනි දින දවල් 1 වනතුරු භාරගෙන එදින එකී වේලාවට කඩා බල නවා ඇත. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරවල පිට "රාගම ආරෝග්‍යශාලාව පිහිටි ඉඩමේ ගස්බද්ද ගැන ඉල්ලුම්පත්‍රය" යනු සඳහන්කළ යුතුයි, ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුකිරීමට ඉල්ලුම්කරන්නාවූ සියළුදෙනාම ඒජන්ත උන්නාන්සේඉදිරියේ තම තමන්ම හෝ තමන් වෙනුවට ක්‍රියාකරන්නෙක් පෙණී සිටින්ට ඕනෑය.

ස්ථිරකරවාගැනීම සඳහා උතුමාණන්වහන්සේ වෙත ඔප්පු කිරීම පිණිස ඒජන්ත උන්නාන්සේ විසින් තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් පහත සඳහන් අංක 2 දරණ කොන්දේසියේ ප්‍රකාර වහාම ඇප තබන්ට ඕනෑය.

ඉල්ලුම්පත්‍රය උතුමාණන්වහන්සේ විසින් පිළිගත් බව දන්වා එවනලද දැන්වීම ලැබී මාසයක්තුළදී මෙහි පහත සඳහන් කොන්දේසි අඩන්ගු බදු පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට

ඕනෑය. එසේ බදු පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට නොයෙදුණොත් ඇප මුදල රජසන්තකකොට බද්ද නැවත විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලුම්කොට ලබාගතහැක.

ජී. එච්. ඩේවිස්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ උප
ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 7වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

කොන්දේසි.

1. රාගම ආරෝග්‍යශාලාව පිහිටි ඉඩමේ තිබෙන ගස්වල බද්ද වර්ෂ 1929ක්වූ ජූලි මස 1වෙනි දින සිට අවුරුදු 5කට විකුණනු ලැබේ.

2. බදුකාරයා විසින් විකිණීම කළ දිනදී හයමාසයක බදු මුදල ඇප වශයෙන් බඳින්ට ඕනෑය. ඉන්පසු කාර්තුවෙන් කාර්තුවට බදුමුදල් කලින් ඒජන්ත උන්නාන්සේට ගෙවිය යුතුය.

3. බදුකාරයාට අයිතිව තිබෙන්නේ ගස්වල ඵලප්‍රයෝජනය පමණකි. (එනම්, පැසිච්ච ගෙඩි පමණක්ය.)

4. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට හෝ කිසිම වැටක් කපන්ටවත්, මායිමක් හෝ ගෙයක් වෙනස්කරන්ටවත් අවසර නැත.

5. බදුකාරයා විසින් එම ඉඩමේ තිබෙන පස්, වැලි ආදිය ගෙනයාම හෝ ඉඩමට හෝ ඉන් කොටසකටවූ යම් හෙයකින් අලාභහානිකිරීම හෝ තහනම්ය.

6. බදුදීමනාකාරයා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් හෝ ක්‍රියාකරන්නන් විසින් හෝ ඉඩමේ වැට බඳින්ට කියා අණකළොත් එසේ කිරීමට බදුකාරයා බැඳෙනවා ඇත.

7. බදුකාරයා විසින් ඉඩමේ වල්පැලෑටි ආදිය නෙලා ඉඩම ශුබ්‍රපවිත්‍රලෙස තබාගන්ටත්, නැමීතිබෙන අතු කපා දැමීමටත් වැටී තිබෙන පොල්ලෙලි ආදිය එකතුකොට ගිනිතැබීමටත් ඕනෑය. මෙය වංශාධිපති ප්‍රධාන සිවිල් වෛද්‍ය නිලධාරීතැන හෝ උන්වහන්සේගේ අණපරිදි ක්‍රියාකරන්නෙකුට පිළිගත යුතු පිළිවෙළකට වියයුතුයි.

8. බදුකාරයා විසින් සියළුම අයබදු ගෙවන්ටත් සනීපාරක්‍ෂක සභාවේ හෝ ගම්සභා කොමිටි අණපනත් ආදියට එකඟව ක්‍රියාකරන්ටත් ඕනෑය.

9. බදුකාරයා විසින් මෙම බද්ද අන් කෙනෙකුට පවරාදීම හෝ විකිණීම ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත සහිත ලියවිල්ලක් නැතුව තහනම්ය.

10. බදුකාරයා විසින් ඉඩමේ තිබෙන ගස් මහරුවට හෝ මීරුවට මැදීම තහනම්ය.

11. සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් බද්ද අවසානවන්ට ප්‍රථම ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්වීට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නාලද මුළු ඉඩම හෝ ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඉදිරියට තිබෙන කාලයට ගස්වල ප්‍රමාණයේ හැටියට ගෙවාපු බදු මුදලින් ආපසු බදුකාරයාට ගෙවන්ට යෙදෙනවා ඇත.

12. බදුදීමනාකාරයාට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට හෝ ක්‍රියාකරන්නන්ට එම කාලය ඇතුළත සුදුසු වේලාවලදී ඉඩමේ තත්වය පරීක්‍ෂාකර බැලීම සඳහා ඉඩමට ඇතුල්වීමට බදුකාරයා විසින් අවසර දියයුතුවේ.

13. ඉඩමේ තිබෙන ලකුණු, කණු හෝ අගල් ආදිය වෙනස් කිරීමට බදුකාරයාට අවසර නැත.

14. ඉහත සඳහන් කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා බදු ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අස්කර භුක්තිය භාරගැනීමට බදුදීමනාකාරයාට හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙකුට හෝ ක්‍රියාකරන්නන්ට බලය තිබේ.

15. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්‍ෂෙපකිරීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

---

මොරටුවැල්ලේ පිහිටි ගස්වල බද්ද.

අංක 19,520 දරණ මුල් සිතියමේ රූඩ්ස් 3කුත් පර්චස් 26·67ක් විශාල අංක 1 දරණ මොරටුව තැපැල් කන්තෝරුව හැදීමට ආණ්ඩුවට ගෙන තිබෙන ඉඩම්කැබෙල්ලේ පිහිටි පොල්ගස් 65කින් ලැබෙන ප්‍රයෝජනයේ බද්ද වර්ෂ 1929ක්වූ ජූලි මස 1වෙනි දින පටන් අවුරුදු එකකට මෙහි පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව බදුගැනීමට ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි.

2. මෙම ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1929ක්වූ ජූනි මස 27වෙනි දින පස්වරු 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගන්නවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑබව ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බද්ද මිලේටගත් අය විසින් බදු මිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස් කරන්ටවත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටත් අවසර නැත.

3. කලවිපොල්, කුරුම්බා යනාදිය ගැනුම්කාරයා විසින් හෝ ඔවුන්ගේ වැඩකරුවන් විසින්වත් කැඩීම තහනම්ය.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

5. බදුකාරයා විසින් සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

6. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

7. මිලේටගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ "ලෝකල් බෝඩ්" නම්වූ ප්‍රදේශික නගර සභාවේ අණපණත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

8. කැපීමට ඕනෑකරණ ගස් සියල්ලම ඒජන්ත උන්නාන්සේට කැප්පවීමට බලය තිබේ. ඊට වැටහෙන මුදල බදුකාරයාට ආපසු දෙනුලැබේ.

9. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් බාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

10. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් බාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ජී. එච්. ඩේවිස්,
බස්නාහිර පලාතේ උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 8වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීමට හෝ බදුගැනීමට දෙන ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීමයි.

### උතුරු මධ්‍යම පලාතේ රජසන්තක ඉඩම් මැණීමේ අයදුම් පත්‍ර පිළිබඳ අවසානකරනුලබන භූමිප්‍රදෙශ.

උතුරු මධ්‍යම පලාතේ ආණ්ඩුව සන්තක ඉඩම් මිලයට හෝ බද්දට ගැනීමේදී එවනුලබන අයදුම්පත්‍ර සම්බන්ධව කරනු ලබන මැණීම මෙහි පහත සඳහන්ප්‍රකාර ප්‍රදෙශ වශයෙන් අඞ්ක පිළිවෙලට බෙදා කරනු ලබන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. අඞ්ක 1කේ ප්‍රදෙශයට කුන්චුට්ටු, කල්පේ, මහපොතාන, කනදර සහ උඩිඹියන්කුලම යන කෝරලද.

අඞ්ක 2කේ ප්‍රදේශයට උලගල්ල, කලාගම්, නැගම්පහ, උපුරුව, කිරලව, මාමිණියා, මාවඹුවා යන කෝරල සහ තමන් කඩුව සහ එගොඩපත්තුවද.

අඞ්ක 3නේ ප්‍රදෙශයට විලච්චිය, නුවරගම්, කඩවත් එපා වල සහ කැඳු යන කෝරලද ඇතුළත් වේ.

3. අඞ්ක 3 දරණ භූමි ප්‍රදෙශතුල පිහිටි ඉඩම් සම්බන්ධ අයදුම්පත්‍රවල කටයුතු වර්ෂ 1929ක්වූ අගොස්තු මස 1වෙනි දිනට අවසන්කරනු ලැබේ. මෙකී දිනට පසුව එම භූමි ප්‍රදෙශය තුල ඉඩම් සඳහා විධානකරනතුරු සර්වේයර් ජනරාල් උන්නාන්සේට යවනු නොලැබේ. එසේදවුවත් මෙකී ප්‍රදෙශය තුල ඉඩම් විකිණීම ගැන හෝ බදුදීම ගැණ යම් විරුද්ධකම් ආදියක් තිබේදැයි දැනගැනීම සඳහා එවනු ලබන අයදුම්පත්‍ර භාරගෙන ලියා පදිංචිකිරීම මෙයින් වලක්වනු නොලැබේ.

මීළඟට අවසන්කරනු ලබන්නේ අඞ්ක 1 සහ 2 දරණ භූමි ප්‍රදෙශයේ.

ඒ. පී. බයිසන්,
උ. ම. දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1929ක්වූ මැයි මස 28වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම්.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබිතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1929ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අලුත්කඩේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි

ආර්. ඕ. ද සේරම්,
බ. දි. දෙ. පිස්කල් වම්හ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 8වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් පුත්තලම් දිස්ත්‍රික්කුවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1929ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසරඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාමට දන්වන්නෙමි.

සී. බී. පී. පෙරේරා,
උප පිස්කල්වම්හ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 11වෙනි දින
පුත්තලමේ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය, වර්ෂ 1929ක්වූ ජූලි මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

සී. එච්. කොලින්,
ස. දි. පිස්කල් වම්හ.

වර්ෂ 1929ක්වූ ජූනි මස 8වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

A. C. RICHARDS, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.